**සමූපකාර තොග වෙළඳ සංස්ථාවේ සහ එහි පරිපාලිත සමාගම්වල - 2019**

----------------------------------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 වියාචනය කළ මතය

සමූපකාර තොග වෙළඳ සංස්ථාවේ (සංස්ථාව) සහ එහි පරිපාලිත සමාගම්වල (සමූහයේ) 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සංස්ථාවේ සහ එහි පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.2 මතය වියාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය වියාචනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ වියාචනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් ඇති විය හැකි බවට අපේක්ෂා කෙරේ .

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ.වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයක් හඳුනා නොගැනීම මගින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබාගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ.කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සංස්ථාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i). **ශ්‍රී.ලං.ගි.ප්‍ර. 16 - දේපල පිරියත හා උපකරණ** | | |
| (අ) ප්‍රමිතයෙහි 51 ඡේදය ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය අඩු තරමින් සෑම මුදල් වර්ෂයක් අවසානයේදීම සමාලෝචනය කළ යුතු අතර අපේක්ෂා තත්ත්වයන් ඉහත දී කළ ඇස්තමේන්තුවලින් වෙනස් වන්නේ නම් එම වෙනස්කම ශ්‍රී.ලං.ගි.ප්‍ර අංක 8 ප්‍රකාරව ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනසක් ලෙස ගිණුම්ගත කළ යුතුය. කෙසේ වෙතත්, 2019 දෙසැම්බර් 31 දිනට ලියාහල අගය රු.490,101,520 ක් වූ සංස්ථාවේ ගොඩනැගිලි, කල්බදු ඉඩම්වල පිහිටි ගොඩනැගිලි වැඩිදියුණු කිරීම්,යන්ත්‍රෝපකරණ , මෝටර් රථ, ලීබඩු හා සවිකිරීම්, පරිගණක උපාංග මෙවලම් හා උපකරණ සහ කාර්යාල උපකරණ | සංස්ථාවට අයත් දේපළ විවිධ ප්‍රදේශ වල ව්‍යාප්ත වී ඇති අතර, ලී බඩු, පරිගණක උපකරණ ආදී වත්කම් සෑම වර්ෂයකදීම සත්‍යාපණය කර අදාල තහවුරු කිරීම් සිදු කිරීම ප්‍රායෝගිකව අපහසුය. 2021 වසරේ වත්කම් තක්සේරුවෙන් අනතුරුව අදාල තහවුරු කිරීම් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීමට කටයුතු කළ හැක. | ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| වල අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය සමාලෝචනය කර නොතිබුණි. | | |
| (ආ) ප්‍රමිතයෙහි 79 (ආ) ඡේදය ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද එහෙත් තවමත් භාවිතයට ගනු ලබන දේපල පිරියත හා උපකරණ වල ධාරණ අගය මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කළ යුතු වුවද, සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද එහෙත් තවමත් භාවිතයට ගනු ලබන සංස්ථාවට අයත් යන්ත්‍රෝපකරණ 44 ක, ලී බඩු හා සවි කිරීම් 2071 ක, මෝටර් රථ 126 ක, මෙවලම් සහ උපකරණ 22 ක , කාර්යාල උපකරණ 146 ක සහ පරිගණක හා පරිගණක උපාංග 308 ක ධාරණ අගය මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි. | සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද තවමත් භාවිතයට ගනු ලබන දේපළ, පිරියත හා උපකරණ වල ධාරණ අගය 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ප්‍රමිතය ප්‍රකාරව හෙළිදරව් කර ඇත. ගිණුම් සටහන් අංක 9.1 යටතේ සංස්ථාව ඇතුළු සමූහයේ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද ස්ථාවර වත්කම් වල ධාරණ අගය ලෙස රු.349,095,841/-දක්වා ඇති අතර ගිණුම් සටහන් අංක 9.3 පරිදි සංස්ථාවේ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් වල ධාරණ අගය ලෙස රු.348,956,141/- දක්වා ඇත. | ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ii). **ශ්‍රී.ලං.ගි.ප්‍ර. 37 - ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම්** | | |
| ප්‍රමිතයෙහි 31 ඡේදය ප්‍රකාරව අස්ථිත්වයක් අසම්භාව්‍ය වත්කම් මූල්‍ය ප්‍රකාශනවල හඳුනානොගත යුතු වුවද, සංස්ථාව විසින් ආනයනික සහල් ව්‍යාපෘතිය යටතේ සිදු වූ තොග අස්ථානගත වීම් සම්බන්ධයෙන් විභාග වෙමින් පවතින නඩුවකින් ලැබිය යුතු බවට අපේක්ෂා කරන රු.25,900,236 ක් වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන තිබුණි. | මේ සඳහා දැනට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නඩුවක් පවතින නිසා නඩුවකින් ලැබිය යුතු ශේෂයන් ලෙස මෙම අගය මූල්‍ය ප්‍රකාශන වල නිරූපණය කර ඇත. | ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කල යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) 2019 දෙසැම්බර් 31 දිනට ගොඩනැගිලි දෙපාර්තමේන්තු තොගය ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති රු.4,143,032 ක් වූ | 2020 වසරේ සිට මෙම ශේෂය හාණිපූරණ සඳහා වෙන් කිරීම සිදු කිරීමට කටයුතු කර ඇත. | භෞතිකව නොපවතින වත්කම් මූල්‍ය ප්‍රකාශන වල වත්කම් වශයෙන් |

| | | |
|---|---|---|
| ගොඩනැගිලි ද්‍රව්‍ය තොගය 2004 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබෙන නමුත් එහි භෞතික පැවැත්ම සම්බන්ධයෙන් විගණන සාක්ෂි මඟින් තහවුරු නොවීය. ඒ අනුව 2019 දෙසැම්බර් 31 දිනට තොග ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | | හඳුනා නොගත යුතුය. |
| (ආ)ලංකා සතොස සමාගමේ කොටස් දායකත්වය වෙනුවෙන් සංස්ථාව මූල්‍ය දායකත්වයක් ලබා දී නොමැති අතර ඒ වෙනුවෙන් සංස්ථාව විසින් ලංකා සතොස සමාගම වෙත බදු පදනම මත සපයා ඇති ගොඩනැගිලි සඳහා 2005 වසරේ සිට 2011 වසර දක්වා සමුච්චිත බදු කුලී වටිනාකම වූ රු.66,986,483 ක් ද ලංකා සතොස අලෙවිසැල් හා ගබඩාවන්හි පරිහරණය සඳහා සංස්ථාව විසින් සපයන ලද ස්ථාවර වත්කම්වල වටිනාකම වූ රු.54,722,228 ක් ද වශයෙන් රු. 121,708,711 ක මුදලක් හිලව් කර තිබුණි. මෙම වටිනාකමින් ලංකා සතොස සමාගම විසින් වෙන්කර දී ඇති රු. 22,798,840 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ආයෝජන වශයෙන් දක්වා තිබුණු අතර ඉතිරි රු. 98,909,871 ක් ආයෝජන අත්තිකාරම් වශයෙන් මූල්‍ය ප්‍රකාශන වල දිගුකාලීන වත්කම් යටතේ දක්වා තිබුණි. කෙසේ වුවද, එම වටිනාකම සම්බන්ධයෙන් ලංකා සතොස සමාගම විසින් එකඟතාවය පළකර නොතිබුණු අතර ලංකා සතොස සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් ප්‍රතිපාදනය කර ද නොතිබුණි. | සමූපකාර තොග වෙළඳ සංස්ථාව විසින් ලංකා සතොස වෙත පවරන ලද වට්ටෝරු භාණ්ඩවල වටිනාකම සහ බදු කුලී පදනම මත ලබා දී ඇති ස්ථාවර වත්කම් (ගබඩා සහ අලෙවිසැල් ගොඩනැගිලි) වෙනුවෙන් 2011.03.31 දක්වා වූ කාලය සඳහා වන සමුච්චිත හිඟ කුලී මුදල සතොස විසින් ලංකා සතොස වෙත ආයෝජිත ප්‍රාග්ධනය වශයෙන් සළකා කොටස් නිකුත් කිරීමට අංක 11/1353/540/017 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලැබී ඇත.<br><br>ඉහත සඳහන් අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ලංකා සතොස විසින් සතොස වෙත රු.22,798,840/- ක කොටස් නිකුත් කර ඇති බැවින්, ඉතිරි හිඟ කොටස් ප්‍රමාණය ද නිකුත් කරන ලෙස අවස්ථා කිහිපයකදීම එම ආයතනය වෙත ඉල්ලීම් කර ඇත. ඒ පිළිබඳව එම ආයතනය විසින් ප්‍රතිචාර නොදැක්වීම සහ ගිණුම්කරණ කටයුතු සිදු නොකිරීම අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි කටයුතු නොකිරීමකි. | බාහිර පාර්ශවයක් විසින් එකඟතාවය පල නොකළ වටිනාකමක් මූල්‍ය ප්‍රකාශන වල ආයෝජන අත්තිකාරම් වශයෙන් හඳුනා නොගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | ප්‍රධාන කාර්යාලය හා සතොස මෝටර්ස් පිහිටි ඉඩමේ ප්‍රත්‍යාගණිත වටිනාකම රු.2,415,000,000 ක් වුවද එහි වටිනාකම රු.2,621,600,000 ක් වශයෙන් ගිණුම්ගත කිරීම හේතුවෙන් ඉඩම් හා ආයෝජන දේපලවල වටිනාකම රු.206,600,000 කින් වැඩියෙන් දක්වා තිබුණි. | මෙම සියළුම වත්කම් 2021 වර්ෂයේ ප්‍රත්‍යාගණනය කර ඇති අතර, 2021 වසරේ සිට නිවැරදිව ගිණුම්ගත කිරීම සිදු කර ඇත. | වත්කම් වල ප්‍රත්‍යාගණිත වටිනාකම ගිණුම්ගත කල යුතුය. |
| (ඇ) | මාතර පිහිටි වර්ග අඩි 2944 ක් වූ ගබඩාවෙහි ප්‍රත්‍යාගණන අගය රු.3,532,800 ක් වුවද එය රු.1,177,600 වශයෙන් ගිණුම්ගත කිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ගොඩනැගිලි වටිනාකම රු.2,355,200 ක් අඩුවෙන් දක්වා තිබුණි. ඒ අනුව මෙම වත්කම සම්බන්ධයෙන් වර්ෂයට අදාල ක්ෂය වීම රු.306,176 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඉ) | ප්‍රත්‍යාගණන වටිනාකම රු.112,943,520 ක් වූ හිගුරක්ගොඩ පිහිටි ගොඩනැගිල්ලක් සංවර්ධනය කිරීමට අදාල අයිතම 15 ක් රු.68,868,000 ක් වශයෙන් ගිණුම්ගත කිරීම හේතුවෙන් කල්බදු ඉඩම් වල පිහිටි ගොඩනැගිලි වැඩිදියුණු කිරීමේ ගිණුමේ ශේෂය රු.44,075,520 කින් අඩුවෙන් දක්වා තිබුණි. ඒ අනුව වර්ෂයේ ක්ෂය වටිනාකම රු. 1,763,021 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණු අතර ක්ෂය වෙන් කිරීමේ ගිණුමේ ශේෂය රු. 8,815,015ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | මෙම සියළුම වත්කම් 2021 වර්ෂයේ ප්‍රත්‍යාගණනය කර ඇති අතර, 2021 වසරේ සිට නිවැරදිව ගිණුම්ගත කිරීම සිදු කර ඇත. | වත්කම් වල ප්‍රත්‍යාගණිත වටිනාකම ගිණුම්ගත කල යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂය තුල ආයතන 05 කින් සංස්ථාව ලද ගොඩනැගිලි කුලී ආදායමට අදාල රඳවාගැනීමේ බදු ප්‍රතිපාදන වටිනාකම රු.1,420,901 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | මේ සම්බන්ධව අදාල ආයතන සමග වැඩිදුරටත් පරික්ෂාකර 2019 වසර සඳහා රඳවා ගැනීමේ බදු සහතික පත් තිබේ නම් 2020 වර්ෂයේ ගිණුම් වල ගැලපීම් කිරීමට පියවර ගනිමි. | රඳවාගැනීමේ බදු නිවැරදිව ගිණුම්ගත කල යුතුය. |

| | | |
|---|---|---|
| (උ) ස්ථාවර තැන්පතු සහ කාලීන තැන්පතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අදාල ලැබිය යුතු පොලී ආදායම රු.920,185 ක් ගිණුම්ගත කර නොතිබුණි. | 2020 වසරේ සිට ස්ථාවර තැන්පතු පොළිය බැංකුව විසින් ලබාදෙන ශේෂ සනාථන ලිපි අනුව වෙනමම නිවැරදිව ගිණුම් තුල දැක්වීමට කටයුතු කර ඇත. | වර්ෂයට අදාල ලැබිය යුතු පොලී ආදායම ගිණුම්ගත කල යුතුය. |
| (ඌ) සමාලෝචිත වර්ෂය සඳහා ස්ථාවර තැන්පතු හා කාලීන තැන්පතු පොලී ආදායම රු.3,812,579 ක් වුවද ,එය රු.1,974,109 ක් වශයෙන් ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂය සඳහා පොලී ආදායම රු.1,838,470 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | සමාලෝචිත වර්ෂයට අදාල පොලී ආදායම නිවැරදිව ගිණුම්ගත කර ඇත. | වර්ෂයට අදාල පොලී ආදායම නිවැරදිව ගිණුම්ගත කල යුතුය. |
| (එ) සමාලෝචිත වර්ෂයේ සංස්ථාවට අයත් ගබඩා 13 ක් නවීකරණය කිරීම සඳහා සතොස ඉංජිනියරින් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන් සමාගම වෙත ගෙවන ලද රු.38,446,618 ක් වූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ( Mobilization Advance ) කෙරීගෙන යන වැඩ වශයෙන් ගිණුම්ගත කිරීම හේතුවෙන් කෙරීගෙන යන වැඩ ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් ද වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් ද දක්වා තිබුණි. | මෙම නවීකරණය මගින් ගබඩාවල ඵලදායි ජීවිත කාලය වැඩිවන අතර, වත්කම් වල වටිනාකම ද ඉහළ ගොස් ඇත. එමනිසා අදාල බිල්පත් ලද වහාම ප්‍රාග්ධණීත කළ යුතු වටිනාකම කෙරීගෙන යන ගිණුමෙන් ඉවත් කර අදාල වත්කම් ගිණුමට හර කිරීමටත්, සුළු අළුත්වැඩියා වියදම්, වියදම් ලෙස ආදායම් ගිණුමට හර කිරීමටත් කටයුතු කරමි. | වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් කෙරීගෙන යන වැඩ වශයෙන් ගිණුම්ගත නොකල යුතුය. |
| (ඒ) සමාලෝචිත වර්ෂයේදී ආනයනික සහල් වලින් ප්‍රයෝජනයට ගත නොහැකි සහල් කි.ග්‍රෑ 345,084 ක් විකිණීමෙන් ලද රු.16,024,500 ක මුදල ආනයනික සහල් ව්‍යාපෘතියට අදාල ආදායමක් ලෙස ගිණුම්ගත නොකර සංස්ථාවේ වෙනත් ආදායම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ආනයනික සහල් ව්‍යාපෘතියේ අලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | 2020 වසරේ ගිණුම් වල පෙර වර්ෂයට අදාල සටහන් තුල මෙම ශේෂය නිවැරදිව දැක්වීමට පියවර ගෙන ඇත. | ආදායම් නිවැරදිව ගිණුම්ගත කල යුතුය. |
| (ඔ) විගණනයට ඉදිරිපත් වූ ගොඩනැගිලි බදුකුලී රේටයන් ඉක්ම වූ රේටයන් මත ගොඩනැගිලි බදු කුලිය ඉන්වොයිස් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ බදුකුලී ආදායම රු.1,239,956 කින් මූල්‍ය ප්‍රකාශන වල වැඩියෙන් දක්වා තිබුණි. | මෙම ඉන්වොයිස් නිකුත්කිරීම සේවා අංශය විසින් සිදු කරන අතර ඒ කිසිදු බදු ගිවිසුමක් මූල්‍ය අංශය වෙත යොමු නොකරයි. එම නිසා එම ගිවිසුම් ප්‍රකාරව සිදුකරන ලද ඉන්වොයිස් වල වෙනස්වීම් පිළිබඳ තොරතුරු සේවා අංශය | නිවැරදි බදුකුලී රේටයන් මත බදු කුලිය ඉන්වොයිස් කල යුතුය. |

| | | |
|---|---|---|
| | වෙතින් විගණන අංශයට ලබාදීමට උපදෙස් ලබා දෙන ලදී. | |
| (ඕ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ලැබිය යුතු බදුකුලී ශේෂය ලෙස රු.250,234,789 ක් දක්වා තිබුණද, ඉන් හඳුනානොගත් තැන්පතු රු.8,684,772 ක් බදු කුලී ලැබීම් ලෙස තහවුරු කර නොගෙන අඩුකර දැක්වීම සහ එකතුව රු.34,932 ක් වූ සෘණ ශේෂ ඇතුළත් වීම හේතුවෙන් ලැබිය යුතු බදුකුලී ශේෂය රු. 8,719,704 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | සංස්ථාව විසින් බදු කුලී සඳහා වන චෙක්පත් හා මුදල් තැන්පත් කිරීමට බැංකු ගිණුම යොදාගෙන ඇත. මෙහි සඳහන් රු.8,684,772/- ක් වන හඳුනා නොගත් තැන්පතු ඉහත ගිණුමට තැන්පත් කර ඇත. එම මුදල් වෙළඳ ආදායම් ලෙස ලද මුදල් නොවන බැවින් ද, බදු කුලී ණයගැති ශේෂ වල පෙර වර්ෂයන් සඳහා ලබා ගත යුතු ණය ශේෂ දක්වා ඇති බැවින් ද, මෙම මුදල කුලී ණයගැති ශේෂයෙන් ඉවත් කර මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇත. | බැංකු ජංගම ගිණුමට ලැබෙන සෘජු ප්‍රේෂණ හඳුනාගෙන නිවැරදි ගිණුම් වලට සටහන් කල යුතුය. |
| (ක) මූල්‍ය ප්‍රකාශන අනුව සතොස ඉදිකිරීම් හා ඉංජිනේරු සමාගමෙන් 2019 දෙසැම්බර් 31 දිනට සංස්ථාව වෙත ලැබිය යුතු බදුකුලී ශේෂය තුළ ගොඩනැගිලි අළුත්වැඩියා වියදම් ඇතුළත් වීම හේතුවෙන් එම සමාගමෙන් ලැබිය යුතු බදුකුලී ශේෂය රු. 3,041,421 කින් වැඩියෙන් දක්වා තිබුණි. | ලැබිය යුතු බදු කුලී ඇතුලත් කර තිබෙන සටහන් අංක . ඉදිරිපත් කර ඇත. | වියදම් නිවැරදිව හඳුනාගෙන අදාල ගිණුම් වල සටහන් කල යුතුය. |
| (ග) ඇතැම් ණයගැති ශේෂ සහ ණයහිමි ශේෂ මූල්‍ය ප්‍රකාශන වල සෘණ ශේෂ වශයෙන් දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයේ ලැබියයුතු ශේෂ සහ ගෙවිය යුතු ශේෂ පිළිවෙළින් රු. 16,737,142 ක් සහ රු.79,483,133 ක් අඩුවෙන් දක්වා තිබුණි. | මෙම ශේෂ අතර 2017 – 2019 වර්ෂවල සහල් මිළට ගැනීම වෙනුවෙන් ගැණුම්කරුවන් වැඩිපුර ගෙවා ඇති ශේෂ දක්වා ඇත. එම ශේෂ ආදායම් ලෙස හඳුනාගෙන වෙන් කිරීම සඳහා අවශ්‍ය අනුමැතියන් ලබා ගෙන ඉදිරි මූල්‍ය ප්‍රකාශණ වලදී ගැළපීමට කටයුතු කරමි.<br>මේ අතර පවතින දිගුකාලීන ශේෂ සැසඳීම් කිරීම සඳහා මූලාශ්‍ර ලේඛන මූල්‍ය අංශය සතුව නොමැති අතර ඉතිරි අනෙකුත් ශේෂයන් නිවැරදිව ඉදිරි ගිණුම් වල ඉදිරිපත් කිරීමට පියවර ගතිමි. දිගුකාලීනව පැවතෙන ශේෂ ඉදිරියේදී කපාහැරීමේ කමිටුවට ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | සෘණ ශේෂ වශයෙන් දක්වා ඇති ණයහිමි ශේෂ සහ ණයගැති ශේෂ විශ්ලේෂණය කර නිවැරදි ශේෂයන් මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතුය. |

| | | |
|---|---|---|
| (ච) 2015 සිට සමාලෝචිත වර්ෂය දක්වා ඉදිරියට ගෙන එමින් පවතින රු.3,129,264 ක් වූ අතැති මුදල් ශේෂය භෞතිකව නොපවතින බව නිරීක්ෂණය විය. | එකගවෙමි. මෙම ශේෂය පරීක්ෂාකළ අතර එය භෞතිකව සංස්ථාව තුල නොපවතින ශේෂයකි. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන මුදල් ශේෂ භෞතිකව පැවතිය යුතුය. |
| (ට) වර්ෂ 10 කට අධික කාලයක සිට පැවත එන අක්‍රීය බැංකු ගිණුම් දෙකක හදුනා නොගත් හර ශේෂ සහ ගෙවිය යුතු ගිණුම් වලට අදාල එකතුව රු. 6,538,568 ක් බැංකු අයිරා ශේෂය වශයෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | 2019 දෙසැම්බර් 31 දිනට ගිණුම් වර්ෂයට අදාල ගෙවීම් ගිණුම්ගත කළයුතු නිසා එම සියලු ගෙවීම් 2019 වසරේ ගිණුම් ගත කළ අතර ගිණුමේ මුදල් නොතිබුණ බැවින් එම ගෙවීම් රදවා තබාගෙන 2020 වසරේ දී මුදල් තැන්පත් වන ආකාරයට අදාල ගෙවීම් සිදුකළ බව දන්වා සිටිමි. | අක්‍රීය බැංකු ගිණුම් වල ඇති ශේෂ නිරවුල් කිරීමට කටයුතු කල යුතු අතර සැපයුම්කරුවන් වෙත ගෙවීම් නොකර ගෙවීම් වශයෙන් ගනුදෙනු මුදල් පොතේ ඇතුලත් නො කල යුතුය. |

**1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්ව යේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ)ඉන්ධන වියදම | 28,171,284 | 21,332,739 | 6,838,545 | මෙම ගෙවීමට අදාල සියළු ගෙවීම් වවුචර විගණනයට ඉදිරිපත් කර ඇත. එම වවුචර් සමඟ ගෙවීම් සදහා අනුමත ලේඛන ඇතුලත් මූලාශ්‍ර ලේඛන ඇතුලත් කර ඇත. | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම අනුරූපී වාර්තා අනුව වටිනාකම සමග සැසදිය යුතුය. |
| (ආ)ලංකා සතොස සමාගමෙන් සංස්ථාව වෙත අයවිය යුතු මුදල | 2,479,639,195 | 2,131,314,280 | 348,324,915 | 2019.12.31 දිනට ලංකා සතොස සමාගම වෙත ශේෂ සනාථ කිරීමේ ලිපි යොමු කරන ලද නමුත්, ඒ සදහා ඔවුන් විසින් පිළිතුරක් | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම අනුරූපී වාර්තා අනුව වටිනාකම සමග සැසදිය යුතුය. |

| | | |
|---|---|---|
| | | සංස්ථාව වෙත යොමු කර නොමැත. එමනිසා ශේෂ සනාථ කිරීමේ කටයුතු කිරීමට නොහැකිව ඇත. ඉදිරි ගිණුම් වර්ෂයේදී ශේෂ සනාථන ලබාගෙන සැසඳීම් කිරීමට කටයුතු කරමි. |

### 1.5.4 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සංස්ථාවේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී පරිපාලිත සමාගම් වන සී/ස සීඩබ්ලිව්ඊ සිකියුරිටීස් ඇන්ඩ් ජෙනරල් සමාගම සහ සී/ස සීඩබ්ලිව්ඊ කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් ඉංජිනියරින් සමාගම යන සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත නොකළ සහ විගණනයට භාජනය නොකළ මූල්‍ය ප්‍රකාශන යොදා ගෙන තිබුණි. | එම සමාගම විසින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා යොමු කරනු ලැබ ඇත්තේ ඔවුන් ගේ මූල්‍ය ප්‍රකාශන පමණක් වන අතර ඔවුන් ඒ සඳහා ලබාගත් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් අප වෙත යොමුකර නොමැත. | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කරන ලද පරිපාලිත සමාගම් වල ගිණුම් යොදාගත යුතුය. |
| (ආ) සීඩබ්ලිව්ඊ සිකියුරිටීස් ඇන්ඩ් ජෙනරල් සමාගමෙහි ආදායම් සංචිතය වන රු.12,143,718 ක අගය ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයේ රඳවාගත් ඉපයුම් යටතේ දක්වා තිබුණි. ඒ අනුව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයේ රඳවාගත් ඉපයුම් රු.12,143,718 කින් වැඩියෙන් ද ආදායම් සංචිතය රු.12,143,718 කින් අඩුවෙන් ද දක්වා තිබුණි. | මෙම ආදායම් සංචිතය පිළිබඳව සතොස ආරක්ෂක සමාගම වෙතින් විමසා ඇති අතර, ඒ සම්බන්ධව නිවැරදි තොරතුරු මෙතෙක් ලබා දී නොමැත. පෙර වර්ෂවල සිට පැවත එන මෙම ශේෂය ඒකාබද්ධ ගිණුම් වල රඳවාගත් ඉපැයුම් යටතේ දක්වා ඇත. | සංස්ථාවේ සහ පරිපාලිත සමාගම් වල මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ කිරීම නිවැරදිව කළ යුතුය. |
| (ඇ) සීඩබ්ලිව්ඊ සිකියුරිටීස් ඇන්ඩ් ජෙනරල් සමාගම විසින් සංස්ථාව වෙත ආරක්ෂක සේවා සැපයීමෙන් ලැබූ රු.7,633,273 ක ආදායම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයේ සමූහයේ පරිපාලන වියදම් සඳහා හිලව් කර තිබුණි. ඒ අනුව සමූහයේ | 2019.12.31 දිනට පරිපාලිත සමාගම් වෙත ශේෂ සනාථ කිරීමේ ලිපි යොමු කරන ලද නමුත්, ඒ සඳහා ඔවුන් විසින් පිළිතුරක් සංස්ථාව වෙත යොමු කර නොමැත. ඉදිරියේදී එම වෙනස | සංස්ථාවේ සහ පරිපාලිත සමාගම් වල මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ කිරීමේදී ආදායම හෝ වියදම සෘණ අගයක් නොවිය යුතුය., |

| | |
|---|---|
| ආරක්ෂක වියදම රු.85,003 ක සෘණ අගයක් වී තිබුණි. | හඳුනා ගැනීමටත්, ශේෂ සැසඳීමටත් කටයුතු කරමි. |

### 1.5.5 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයේ සංස්ථාවේ මුළු වත්කම් ඉක්ම වූ මුළු වගකීම් රු.2,307,524,723 ක් මෙන්ම ජංගම වත්කම් ඉක්ම වූ ජංගම වගකීම් රු.3,847,846,067 ක් වූ අතර ඒ හේතුවෙන් සමාගමට සිය වත්කම් තුළින් එහි වගකීම්වලට මුහුණ දීමේ හැකියාව සහ භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබා දීමකින් තොරව අඛණ්ඩව පවත්වා ගෙන යාමේ හැකියාව අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි. | කළමණාකාරීත්වය විසින් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව නිරන්තර අවධානය යොමු කරන අතර, පවතින සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට අවශ්‍ය සියළුම ක්‍රියා මාර්ග ගනු ලබන බව ද, ඒ සම්බන්ධ අවශ්‍ය උපදෙස් මහා භාණ්ඩාගාරය හා වෙළඳ අමාත්‍යාංශය වෙතින් ලබා ගන්නා බව ද කාරුණිකව දැනුම් දෙමි. | සංස්ථාවේ වගකීම් වලට මුහුණ දීමට හැකි වත්කම් තත්වයක් පවත්වා ගත යුතුය. |

### 1.5.6 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (i) භාණ්ඩාගරයට ගෙවිය යුතු ශේෂ | | | | |
| (අ)ණය පියවීම් | 98,718,402 | වටිනාකම තහවුරු කිරීමේ ලේඛන | මේ සම්බන්ධව තහවුරු කිරීමේ ලිපියක් මහජන බැංකුව වෙතින් ඉල්ලා සිටි අතර, එම තහවුරුව ලද විගස විගණනයට යොමු කරමි. | අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් කල යුතුය. |
| (ආ) ණය ප්‍රතිව්‍යුහගත කිරීම් | 275,000,000 | වටිනාකම තහවුරු කිරීමේ ලේඛන | 2006 වසරේ සිදු වූ මෙම ගණුදෙනු වලට සම්බන්ධ වටිනාකම තහවුරු කිරීමේ ලේඛන සතොස මූල්‍ය අංශයේ නොමැති බව කාරුණිකව දන්වා සිටිමි. | වටිනාකම තහවුරු කිරීමේ ලේඛන මූල්‍ය අංශය විසින් පවත්වා ගත යුතුය. |
| (ඇ)සතොස සිල්ලර සමාගම(SRL) | | | | |
| ණයහිමියෝ | | | | |
| බැංකු වගකීම් | 655,000,000 | -එම- | | |
| ලද විකුණුම් | 225,000,000 | | 2003 වසරේ සතොස | |

| | | | | |
|---|---|---|---|---|
| වටිනාකම | 680,000,000 | | සිල්ලර සමාගම ඇවර කරන ලද අතර, මෙම ශේෂයන් 2003 වසරේ සිට මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීම සිදු කරනු ලබයි. දැනට වසර 18 කට පෙර සිදු වූ මෙම ගණුදෙනු පිළිබද වටිනාකම තහවුරු කිරීම සඳහා මූල්‍ය අංශය සතුව ඇති ලේඛන ඉදිරිපත් කර ඇත. | අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් කල යුතුය. |
| (ඇ)On SRL | 200,000,000 | -එම- | 2003 වසරේ සතොස සිල්ලර සමාගම ඇවර කරන ලද අතර, මෙම ශේෂයන් 2003 වසරේ සිට මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීම සිදු කරනු ලබයි. දැනට වසර 18 කට පෙර සිදු වූ මෙම ගණුදෙනු පිළිබද වටිනාකම තහවුරු කිරීමට ලේඛන කිසිවක් මූල්‍ය අංශයේ නොමැත. | වටිනාකම තහවුරු කිරීමේ ලේඛන මූල්‍ය අංශය විසින් පවත්වා ගත යුතුය. |
| (ඉ)On paddy project | 254,149,693 | වටිනාකම තහවුරු කිරීමේ ලේඛන | මෙම ගණුදෙනු පිළිබද වටිනාකම තහවුරු කිරීමට ලේඛන කිසිවක් මූල්‍ය අංශයේ නොමැති බව දන්වා සිටිමි. | වටිනාකම තහවුරු කිරීමේ ලේඛන මූල්‍ය අංශය විසින් පවත්වා ගත යුතුය. |
| (ii) දිගුකාලීන හිගහිට් වෙළද ණයගැති ශේෂය | 6,214,481 | ලෙජර ගිණුම්, ඉන්වොයිසි, ලදුපත්, හානිකරණය සඳහා අනුමැතිය | මෙම එක් එක් ලෙජර් ගිණුම් 2011 ට පෙර සිට පැවත එන අතර, එම ලේඛන වලට අදාල තොරතුරු දැනට මූල්‍ය අංශය තුල නොමැත. දිගුකාලීනව පැවතෙන ශේෂ ඉදිරියේදී කපාහැරීමේ කමිටුවට ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් කල යුතුය. |
| (iii) දිගුකාලීන හිගහිට් වෙනත් ණයගැතියෝ | 170,370,348 | ඉන්වොයිසි, ලදුපත්, කාල විශ්ලේෂණ , | මෙම ශේෂයන් ගිණුම් වල දැක්වෙන්නේ 2011 ට පෙර සිට වන අතර, අප විසින් දැනට ගිණුම් කටයුතු සිදු කරනු ලබන පද්ධතිය තුල | වටිනාකම තහවුරු කිරීමේ ලේඛන මූල්‍ය අංශය විසින් පවත්වා ගත |

| | | | | |
|---|---|---|---|---|
| | | හානිකරණය සඳහා අනුමැතිය | 2011 වසරේ සිට ලෙජර් ගිණුම් ශේෂ පමණක් ඇතුලත් කර ඇති නිසා ඉන් පෙර වසර වල ලෙජර් ගිණුම් පරික්ෂා කිරීමට හැකියාවක් නොමැත. එම ශේෂයන් සනාථ කිරීම සදහා මූලාශ්‍ර ලේඛන ගිණුම් අංශය සතුව නොමැත. | යුතුය. |
| (iv) වෙනත් ණයගැතියෝ- ගමට සවිය ව්‍යාපෘතිය | 42,568,994 | ඉන්වොයිසි, ලදුපත් | මෙම ව්‍යාපෘතිය 2014/2015 කාල සීමාව තුල සිදු කර ඇත. මේ සම්බන්ධ ඉන්වොයිස් සහ ලදුපත් එම වර්ෂ වල විගණනයට යොමුකර ඇත. | අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් කල යුතුය. |
| (v) දිගුකාලීන හිඟගිටි කුළී ණයගැතියෝ | 88,071,071 | ලෙජර ගිණුම්, ඉන්වොයිසි, ලදුපත් කාල විශ්ලේෂණ | එම ශේෂයන් සනාථ කිරීම සදහා මූලාශ්‍ර ලේඛන ගිණුම් අංශය සතුව නොමැත. | වටිනාකම තහවුරු කිරීමේ ලේඛන මූල්‍ය අංශය විසින් පවත්වා ගත යුතුය. |
| (vi) සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු<br>- සී/ස සතොස සිල්ලර සමාගම | 110,878,720 | ලැබිය යුතු ශේෂය සම්බන්ධ ලිපි ලේඛන | 2003 වසර හා ඊට පෙර වර්ෂ වල සිදු වූ ගණුදෙනු සම්බන්ධ ලිපි ලේඛන මේ වන විට සතොස මූල්‍ය අංශය සතුව නොමැත. | වටිනාකම තහවුරු කිරීමේ ලේඛන මූල්‍ය අංශය විසින් පවත්වා ගත යුතුය. |
| - සී/ස ලංකා සතොස | 24,202,985 | ලැබිය යුතු ශේෂය සම්බන්ධ ලිපි ලේඛන | මෙම ශේෂය පරිපාලිත සමාගම් වල පවතින ජංගම ගිණුම් ශේෂය යටතේ ලංකා සතොස ලිමිටඩ් වෙතින් ලැබිය යුතු ශේෂයක් ලෙස 2010 මූල්‍ය වාර්තාවල සදහන් කර තිබේ. අප විසින් දැනට ගිණුම් කටයුතු සිදු කරනු ලබන Busy පද්ධතිය තුල 2011 වසරේ සිට ලෙජර් ගිණුම් ශේෂ පමණක් ඇතුලත් කර ඇති නිසා ඉන් පෙර වසර වල ලෙජර් ගිණුම් මූල්‍ය අංශය සතුව නොමැත. | -එම- |

| | | | | | |
|---|---|---|---|---|---|
| (vii) | ව්‍යවස්ථාපිත ලැබිය යුතු ශේෂ ජාතිය ගොඩනැගීමේ බදු | 234,321,615 | ලැබිය යුතු ශේෂය සම්බන්ධ ලිපි ලේඛන | මේ සම්බන්ධව කිසිදු ලේඛනයක් මූල්‍ය අංශය සතුව නොමැත. | වටිනාකම තහවුරු කිරීමේ ලේඛන මූල්‍ය අංශය විසින් පවත්වා ගත යුතුය. |
| (viii) | දිගුකාලීන හිගගිටි වෙළඳ ණය හිමි ශේෂය | 3,519,166 | ඉන්වොයිසි , ගෙවීම් විස්තර, කාල විශ්ලේෂණ | මෙම ශේෂ සඳහා අදාල ඉන්වොයිස් සම්බන්ධ ලිපි ලේඛන කිසිවක් සංස්ථාව සතුව නොමැත. | අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් කල යුතුය. |
| (ix) | දිගුකාලීන හිගගිටි වෙනත් ණය හිමි ශේෂ | 187,678,063 | ඉන්වොයිසි , ගෙවීම් විස්තර, කාල විශ්ලේෂණ | මෙම ශේෂයන් 2011 වසරට පෙර සිට මූල්‍ය ප්‍රකාශණ වල නිරූපණය වේ. මේ සඳහා මූලාශ්‍ර ලේඛන ගිණුම් අංශය සතුව නොමැත. | වටිනාකම තහවුරු කිරීමේ ලේඛන ගිණුම් අංශය විසින් පවත්වා ගත යුතුය. |
| (x) | ගෙවිය යුතු එකතු කල අගය මත බදු | 187,711,507 | ගණනය කිරීම් හා ගෙවීම් | ගිණුම් ශේෂ 03 ක එකතුවෙන් රු.187,711,507 ශේෂය සකස් වී ඇති අතර, අප විසින් මේ වන විට අදායම් බදු දෙපාර්තුමේන්තුවේ සඳහන්ව ඇති තොරතුරු වලට අනුව එකතු කළ ආදායම මත බදු ගෙවීම සැසදීම් කරනු ලබන අතර ඔවුන්ගේ වාර්තා වලට අනුව මේ වන විට 2018 වසර අවසානය තෙක් අදාල බදු මුදල් ගෙවීම් කර ඇත. 2019 වසරේ ගෙවීමට ඇති බදු මුදල් පිලිබඳව මේ දිනවල සැසදීම් සිදු කරමින් ඇති නිසා නිවැරදි තොරතුරු වලට අනුව ඉදිරි ගිණුම්කරණ කටයුතු සිදුකරන බව දැණුම් දෙමි. | අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් කල යුතුය. |
| (xi) | තැන්පතු සහ අත්තිකාරම් - දිගුකාලීන | 29,692,440 | තැන්පතු ලදුපත් | ශේෂයන් සනාථ කිරීම සඳහා මූලාශ්‍ර ලේඛන ගිණුම් අංශය සතුව නොමැත. | වටිනාකම තහවුරු කිරීමේ ලේඛන ගිණුම් අංශය විසින් පවත්වා ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (xii) වෙනත් ආයෝජන සතොස සිල්ලර සමාගම | 171,928,690 | වටිනාකම තහවුරු කිරීමේ ලේඛන | මෙම ශේෂයන් 2011 වසරට පෙර සිට මූල්‍ය ප්‍රකාශන වල නිරූපණය වේ. මේ සඳහා මූලාශ්‍ර ලේඛන ගිණුම් අංශය සතුව නොමැති බව දන්වා සිටිමි. | වටිනාකම තහවුරු කිරීමේ ලේඛන ගිණුම් අංශය විසින් පවත්වා ගත යුතුය. |
| (xiii) ලැබිය යුතු පොලී ගිණුමේ 2018 ජනවාරි 01 ශේෂය | 1,039,739 | ස්ථාවර තැන්පතු වලට අදාල බැංකුවෙන් ලද අළුත් කිරීමේ නිවේදන | මෙම ගිණුමේ ශේෂය 2013 වසරේ ගිණුම් වලින් පැවත එන ශේෂයකි. 2019 වසරට අදාල පොළී ලැබීම නිවැරදිව ගැලපීම් සිදුකර ඇත. | අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් කල යුතුය. |
| (xiv) විශේෂ ව්‍යාපෘති සඳහා ගෙවිය යුතු ශේෂ | | | | |
| (අ)Crate payables | 7,731,857 | ඉන්වොයිසි, ගෙවීම් විස්තර, කාල විශ්ලේෂණ | මේ වන විට මෙම ලේඛන මූල්‍ය අංශයේ නොමැත. | වටිනාකම තහවුරු කිරීමේ ලේඛන මූල්‍ය අංශය විසින් පවත්වා ගත යුතුය. |
| (ආ)සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | 19,926,051 | ඉන්වොයිසි, ගෙවීම් විස්තර, කාල විශ්ලේෂණ | මෙම ශේෂය සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සතොස වෙත 2011 වසරේදී ලබාදුන් ණය මුදලක් ලෙස ගිණුම් වල දක්වා ඇත. 2012 වසරේ සිට රු.19,926,051ක බැර ශේෂයක් මෙම ගිණුමේ දක්වා ඇත. | අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් කල යුතුය. |
| (ඇ)Millers Payables | 47,753,691 | ඉන්වොයිසි, ගෙවීම් විස්තර, කාල විශ්ලේෂණ | මෙම ශේෂය තුල ඇතුලත් වන ශේෂ අතර රු. 16,500,960/= ශේෂ 2011 පෙර සිට පැවත එන ශේෂ වේ. මෙම ශේෂ පිලිබඳව මූලාශ්‍ර ලේඛන නොමැති බැවින් කපා හැරීම සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු | අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | කරමි. ඉතිරි ශේෂ 2011 පසු 2017 දක්වා ලෙජර් ගිණුම් වල පවතින ශේෂ වේ. මෙම ශේෂ සැසඳීම් කර 2021 වසරේ ගිණුම් වල දැක්වීමට කටයුතු කරමි. | |
| (ඇ)ඇසුරුම් ද්‍රව්‍ය | 10,191,665 | ඉන්වොයිසි , ගෙවීම් විස්තර, කාල විශ්ලේෂණ | මෙම ව්‍යාපෘතිය 2011 වසරේ සිට 2014 දක්වා ක්‍රියාත්මක කර ඇති අතර මුලාශ්‍ර ලියවිලි මුල්‍ය අංශයේ නොමැති බව දන්වා සිටිමි. | වටිනාකම තහවුරු කිරීමේ ලේඛන මුල්‍ය අංශය විසින් පවත්වා ගත යුතුය. |
| (ඉ)ප්‍රවාහන | 5,275,761 | ඉන්වොයිසි , ගෙවීම් විස්තර, කාල විශ්ලේෂණ | මෙම ව්‍යාපෘතිය 2011 වසරේ සිට 2014 දක්වා ක්‍රියාත්මක කර ඇති අතර මුලාශ්‍ර ලියවිලි මුල්‍ය අංශයේ නොමැති බව දන්වා සිටිමි. | වටිනාකම තහවුරු කිරීමේ ලේඛන මුල්‍ය අංශය විසින් පවත්වා ගත යුතුය. |
| (ඊ)ආපසු ගෙවියයුතු තැන්පතු (Millers) | 4,605,106 | ගෙවීම් ලදුපත් | -එම- | -එම- |
| (උ)Other Paddy Operations | 11,523,151 | ඉන්වොයිසි , ගෙවීම් විස්තර, කාල විශ්ලේෂණ | -එම- | -එම- |
| (ඌ)ඉරිඟු ව්‍යාපෘතිය (Maize Project) | 16,442,700 | ඉන්වොයිසි , ගෙවීම් විස්තර, කාල විශ්ලේෂණ | මෙම ව්‍යාපෘතිය 2016-2017 වර්ෂ වල ක්‍රියාත්මක වී ඇත. මෙහිදී CIC Grain ආයතනය විසින් ඉදිරිපත් කරන ලද ලියවිලි වල මුල් පිටපත් නොවූ බැවින් මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් පත් කරන ලද ගෙවීම් කමිටුව විසින් එම ගෙවීම රදවා ගන්නා ලදී. මෙහි සඳහන් වන්නේ එම ආයතනයට ගෙවීම සඳහා වන ඉතිරි | අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | මුදලයි. මෙම ව්‍යාපෘතියට අදාල ලේඛන විගණන අංශය වෙත යොමු කිරීමට කටයුතු කරමි. | |
| (එ)සහල් අපනයන ව්‍යාපෘතිය | 22,797,153 | ඉන්වොයිසි , ගෙවීම් විස්තර, කාල විශ්ලේෂණ | ව්‍යාපෘතිය 2013/2014 වසර වල ක්‍රියාත්මක කර තිබුණු අතර 2013.07.31 දින ප්‍රධාන කාර්යාලයේ 07 වන මහලෙහි ඇති වූ හදිසි ගිණි ගැනීම හේතුවෙන් ආයතනය සතු පැරණි ලිපි ලේඛන රාශියක් ගින්නෙන් විනාශයට පත් විය.<br>ඒ හේතුවෙන් මෙහි සඳහන්ව ඇති සමහර ලිපි ලේඛන (2013 වසරට පෙර කාලයට අයත්) ඉදිරිපත් කිරීමට හැකියාවක් නොමැති බව ද සඳහන් කරමි. | මූලාශ්‍ර ලේඛන වල ආරක්ෂාව සම්බන්ධයෙන් ආරක්ෂක විධිවිධාන යෙදිය යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) දීර්ඝ කාලයක් මුළුල්ලේ ලැබිය යුතු බදු කුලී ලෙස දක්වා තිබුණු රු.88,071,071 ක මුදල අයකර ගැනීමට සංස්ථාව විසින් කටයුතු කර නොතිබුණු අතර හානිකරණය සඳහා සියයට100 ක් ප්‍රතිපාදනය කර තිබුණි. | මෙහි සඳහන් බදු කුලී මුදල් සම්බන්ධව කිසිදු මූලාශ්‍ර ලේඛනයක් හෝ මෙම ලේජර ගිණුම් සකස්වී ඇති ආකාරය පිළිබඳව සොයා බැලීමට 2011 වසරට පෙර සංස්ථාවේ මූලික ලේජරයක් නොමැති වීම නිසා මෙම ශේෂ අයකර ගැනීමට නෛතික ක්‍රියාමාර්ගයක් හෝ ගැනීමට නොහැකි වී ඇත. දීර්ඝ කාලයක් පැවතෙන මෙම ශේෂයන් සඳහා මුදල් ලබා ගැනීමේ ශක්‍යතාවය ඌන වී ඇති බැවින් ගිණුම් ප්‍රමිත අංක 36 ලබා දී ඇති උපදෙස් පරිදි හානිපූරණ වෙන් කිරීම් සිදුකර ඇත. | ලැබිය යුතු බදු කුලී අය කර ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) ලැබිය යුතු වෙළෙඳ ශේෂ යටතේ දක්වා ඇති එකතුව රු.64,538,436 ක් වූ ශේෂයෙන් කිසිදු මුදලක් අයකර ගැනීමට සංස්ථාව විසින් කටයුතු කර නොතිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩල උපදෙස් පරිදි කමිටුවක් පත් කරන ලද අතර, ඔවුන් විසින් මෙම ශේෂ අදාල ආයතන සමඟ සැසඳීම් කර අයකර ගැනීමට කටයුතු කරනු ලබයි. | ලැබිය යුතු බදු කුලී අය කර ගත යුතුය. |
| (ඇ) සම්බන්ධිත පාර්ශවයන්ගෙන් අයවිය යුතු ශේෂය වශයෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණු රු.24,202,985 ක මුදල සංස්ථාව විසින් අයකරගෙන නොතිබුණු අතර සියයට 100 ක හානිකරණය සඳහා වෙන්කිරීම් සිදුකර තිබුණි. | මෙම ශේෂය පරිපාලිත සමාගම් වල පවතින ජංගම ගිණුම් ශේෂය යටතේ ලංකා සතොස ලිමිටඩ් වෙතින් ලැබිය යුතු ශේෂයක් ලෙස 2010 මූල්‍ය වාර්තාවල සඳහන් කර තිබුණි. අප විසින් දැනට ගිණුම් කටයුතු සිදු කරනු ලබන පද්ධතිය තුල 2011 වසරේ සිට ලෙජර් ගිණුම් ශේෂ පමණක් ඇතුලත් කර ඇති නිසා ඉන් පෙර වසර වල ලෙජර් ගිණුම් පරික්ෂා කිරීමට හැකියාවක් නොමැත. එම නිසා මෙම ශේෂය සකස් වී ඇති ආකාරය පිලිබදව පිළිතුරු ලබා දීමට ප්‍රමාණවත් සාක්ෂි මූල්‍ය අංශය සතුව නොමැත.<br>එම නිසා මෙහි දක්වා ඇති ශේෂය අයකර ගැනීමට හැකියාවක් නොමැති බැවින් ගිණුම් ප්‍රමිත අංක 36 දක්වා ඇති පරිදි හානිකරණය සඳහා වෙන්කිරීම් සිදුකර මූල්‍ය වාර්තා සකස් කර ඇත. | අයවිය යුතු ශේෂ අය කර ගත යුතුය. |
| (ඈ) සංස්ථාව විසින් ආනයනික සහල් ව්‍යාපෘතිය යටතේ 2018 වර්ෂයේදී පුද්ගලික සමාගමක් වෙත රු.436,164,234 ක් වටිනා සහල් තොග විකුණා තිබුණු අතර , ඒ සඳහා 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව පැවති රු.118,011,334 ක මුදල පියවීම සඳහා ලබාදී තිබුණු සියළුම චෙක්පත් අගරු වී තිබුණි. සංස්ථාව විසින් ණය පදනම මත සහල් ලබාදීමේදී රු.100,000,000 ක බැංකු ඇපකර 02 ක් ලබාගෙන තිබුණු අතර එම ඇපකර සත්‍ය ලේඛන බවට තහවුරු කර ගෙන නොතිබුණි. තවද සමාගම විසින් දිගින් දිගටම ණය නොගෙවා සිටියදී ද සමාගම වෙත අඛණ්ඩව සහල් නිකුත් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් | සංස්ථාවෙන් ආනයනික සහල් තොග ලබාගෙන රු.118,011,334/- මුදලක් වංචා කිරීම සම්බන්ධව , අගරු චෙක්පත් ලබාදීම සහ ව්‍යාජ බැංකු ඇපකරයක් ලබාදීම සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුවට පැමිණිලි කර ඒ සම්බන්ධයෙන් කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇති අතරම, කොලඹ වාණිජ මහාධිකරණයේ සිවිල් නඩුවක් ද මේ සම්බන්ධයෙන් විභාග වෙමින් පවතී. | ණය පදනමින් භාණ්ඩ සැපයීමේදී අය කර ගැනීමේ හැකියාව තහවුරු කර ගත යුතුය. |

| | | |
|---|---|---|
| 31 වන විට මෙම බැංකු ඇපකර සාවද්‍ය ලේඛන බවට හෙළිදරව් වී තිබුණි. මෙම මුදල් ගෙවීම පැහැර හැරීම නිසා සංස්ථාව විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණිලි කර තිබුණු අතර මේ සම්බන්ධයෙන් කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් විභාගවෙමින් පැවතුණි. | | |
| (ඉ) ආනයනික සහල් විකිණීම වෙනුවෙන් ගැනුම්කරුවෙකුගෙන් අයවිය යුතු මුදල වශයෙන් 2019 දෙසැම්බර් 31 දිනට රු.5,574,811 ක් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. ණය පදනම මත සහල් ලබාගත් බව ගැනුම්කරු විසින් ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් ඒ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත සංස්ථාව විසින් පැමිණිලි කර තිබුණි. | ආනයනික සහල් විකිණීම වෙනුවෙන් අදාල පුද්ගලයාට විරුද්ධව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණිලි කර ඇති අතර, ඒ අනුව විමර්ශන කටයුතු ආරම්භ කර ඇත. දැනට ප්‍රකාශ ලබාගැනීම් සිදුකර ඇත. තවද ඩබ්.ආර්. විජිත යන අයට සහල් විකිණීම හා මුදල් ලැබීම් සම්බන්ධව සම්පූර්ණ විගණනයක් සිදුකර විගණන වාර්තාවක් ලබාදෙන ලෙස අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව දැනුම්දී ඇති අතර, ඒ අනුව ස්වාධීන විගණනයක් සිදුකරමින් පවතී. | ණය පදනමින් භාණ්ඩ සැපයීමේදී අය කර ගැනීමේ හැකියාව තහවුරු කර ගත යුතුය. |
| (ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලංකා සතොස සමාගමෙන් සහ වී අලෙවි මණ්ඩලයෙන් සංස්ථාව වෙත අයවිය යුතු මුදල පිළිවෙලින් රු.2,479,639,197 ක් සහ 93,831,476 ක් වූ අතර සංස්ථාව විසින් ලංකා සතොස සමාගම වෙත සහ වී අලෙවි මණ්ඩලය වෙත ගෙවිය යුතු මුදල පිළිවෙලින් රු 89,228,614 ක් සහ රු.1,000,666,192 ක් වී තිබුණි. මෙම අයවිය යුතු සහ ගෙවිය යුතු ශේෂයන් වසර ගණනාවක සිට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අතර ඒ සම්බන්ධයෙන් අදාල ආයතන සමග එකගතාවයකට පැමිණ එම මුදල් අයකර ගැනීමට හා ගෙවීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි. | 2019 සැප්තැම්බර් මාසයෙන් පසුව වී අලෙවි මණ්ඩලය විසින් සතොස ගබඩා භාරදී ඇත. මේ සම්බන්ධ ලේඛන සියල්ල එම ආයතනය වෙත යොමු කර ඇති අතර ශේෂ සැසදීම් කටයුතු සිදු වෙමින් පවතී.<br>ලංකා සතොස ආයතනයෙන් ලැබිය යුතු මුදලින් කොටසක් 2020 සහ 2021 වර්ෂවලදී එම ආයතනය විසින් සංස්ථාව වෙත ගෙවා ඇත.<br>ආනයනික සහල් සහ දේශීය සහල් අලෙවිය වෙනුවෙන් ලැබිය යුතු ඉතිරි මුදල් ගෙවීම සඳහා ලංකා සතොස විසින් ගෙවීම් සැලැස්මක් යෝජනා කර ඇත. ලංකා සතොස විසින් සතොස ආයතනයෙන් දේශීය සහල් ලබා ගැනීම වෙනුවෙන් | අදාල ආයතන සමග එකගතාවයකට පැමිණ ලැබිය යුතු සහ ගෙවිය යුතු ශේෂ නිරවුල් කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ලැබිය යුතු මුදල් 2022.09.01 දින සිට වාරික ලෙස සතොස වෙත ගෙවීමට එකග වූ බැවින් එම මුදල් වලින් වී අලෙවි මණ්ඩලයට ගෙවීමට ඇති මුදල් ගෙවීමට කටයුතු කරමි.<br>ලංකා සතොස ආයතනයෙන් සතොස වෙත ලැබීමට ඇති මුදල් ප්‍රමාණය ලංකා සතොස වෙත ගෙවීමට ඇති මුදල් ප්‍රමාණය ඉක්මවා යන බැවින් එම මුදල් ගෙවීමට ලංකා සතොස ආයතනය ඉදිරිපත් කරනු ලබන ගෙවීම් සැලැස්ම පිලිබදව සලකා බලා ඉදිරි කටයුතු සිදුකරමි. | |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 103, 104 | (i) සංස්ථාව විසින් ලංකා සතොස සමාගම වෙත ලබාදී ඇති භාණ්ඩ ප්‍රවාහන සේවාව වෙනුවෙන් 2018 හා 2019 වර්ෂයන් සඳහා ලැබිය යුතු ආදායමින් ප්‍රවාහනයේදී සිදු වී ඇති රු.19,299,267 ක මාර්ගස්ථ අඩුමාන සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මාර්ගස්ථ අඩුමාන සම්බන්ධව පත් කරන ලද කමිටුවේ නිර්දේශ මත කටයුතු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය වෙත කරුණු ඉදිරිපත් කර ක්‍රියා කිරීමට නියමිතය. | මාර්ගස්ථ අඩුමාන සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | (ii) 2019 වර්ෂය තුල සිදුවූ වාහන අනතුරු 12 කට අදාලව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | වාහන අනතුරු සම්බන්ධයෙන් රක්ෂණ වන්දි ලබා ගැනීමට කටයුතු කරන ආකාරයට මින් ඉදිරියේදී ඒ සම්බන්ධව සිදු කරනු ලබන මූලික විමර්ශණ අනුව වගකිව යුතු සතොස සේවකයන්ට එරෙහිව ද ක්‍රියා කිරීමට නියමිතය. | වාහන අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු අළ යුතුය. |
| (ආ) 2019 දෙසැම්බර් 09 දිනැති අංක PED/03/2019 සහ 2018 දෙසැම්බර් 07 දිනැති PED/03/2018 අංක දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ | ඉකුත් වර්ෂයේදී සංස්ථාව අලාභ ලබා තිබියදී සමාලෝචිත වර්ෂය සඳහා සංස්ථාව විසින් රු.3,277,275 ක් ප්‍රසාද දීමනා වශයෙන් ගෙවා තිබුණි. | 2019 කෙටුම් පත් ගිණුම තුල සංස්ථාවේ ලාභයක් නිරූපණය විය. මෙම කෙටුම්පත් ලාභය පදනම් කරගෙන 2019 වර්ෂයට අදාල ප්‍රසාද දීමනා ගෙවීම සිදු කරනු ලැබිණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,003,047,978 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 2,236,445,017 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,233,397.039 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට වර්ෂය තුළ ක්‍රියාත්මක කල දේශීය සහ ආනයනික සහල් ව්‍යාපෘති වල අලාභය රු. 1,438,007,124 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සංස්ථාව විසින් ලංකා සතොස සමාගම වෙත ලබාදී ඇති භාණ්ඩ තොග ප්‍රවාහන සේවාව වෙනුවෙන් 2018 හා 2019 වර්ෂයන් සඳහා ලැබිය යුතු ආදායමින් ප්‍රවාහනයේදී සිදු වී ඇති මාර්ගස්ථ අඩුමාන හේතුවෙන් ඉන්වොයිස් වටිනාකමින් රු..19,299,267 ක අදායමක් අහිමි වී තිබුණි. | මාර්ගස්ථ තොග අඩුමාන විමර්ශණ කමිටුවේ නිර්දේශ පරිදි කටයුතු කර අහිමි වී ඇති ආදායම එම මාර්ගස්ථ අඩුමාන සඳහා වගකිව යුතු පාර්ශවයන්ගෙන් අය කර ගැනීමට නියමිතය. | මාර්ගස්ථ අඩුමාන වගකිව යුතු පාර්ශවයන්ගෙන් අය කර ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) ප්‍රත්‍යාගණන වාර්තාවේ සඳහන් මිල ගණන් වලට වඩා අඩුවෙන් වර්ග අඩියක මිල නියම කිරීම හේතුවෙන් බදු දෙන ලද දේපල වලින් සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාවට අහිමි වූ ආදායම රු.104,766,732 ක් වී තිබුණි. | ප්‍රධාන කාර්යාලය තුල ස්ථාපිත පාරිභෝගික අධිකාරිය සඳහා අඩු අගයකට බදු පදනම මත ලබා දී තිබුණ ද, ඉදිරියේදී ඒ සඳහා නියමිත තක්සේරු අගය මත බදු ගිවිසුම් සඳහා එළඹීමට නියමිතය. | ප්‍රත්‍යාගණන වාර්තාවේ සඳහන් මිල ගණන් අනුව බදු කුලී අය කළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සංස්ථාව විසින් දේපල බදු දීමේදී ලිඛිත ගිවිසුම් වලට එළඹීමට කටයුතු නොකල අවස්ථා 27ක් සහ කාලය ඉකුත් වූ බදු ගිවිසුම් අලුත් කිරීමට කටයුතු නොකල අවස්ථා 06 ක් නිරීක්ෂණය විය. | දේපළ බදු ගිවිසුම් සම්බන්ධයෙන් ඇති අඩුපාඩු නිවැරදි කරමින් සකස් කළ යුතු සියළු බදු ගිවිසුම් නිම කරමින් පවතී. | දේපල බදු දීමේදී ලිඛිත ගිවිසුම් වලට එළඹීමට කටයුතු කල යුතුය. |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාව සතු දේපල අතුරින් කුලියට දීමට කටයුතු නොකර නිශ්කාර්යව පැවති වර්ග අඩි ප්‍රමාණය 207796 ක් වූ අතර 2015 වර්ෂයේ ඉදිරිපත් කර ඇති වත්කම් ප්‍රත්‍යාගණන වාර්තාවේ සඳහන් බදු කුලිය අනුව මෙම ගොඩනැගිලි නිශ්කාර්යව පැවතීමෙන් වාර්ෂිකව රු.80,401,440 ක ආදායමක් සංස්ථාවට අහිමි වී තිබුණි. | වරින් වර පුවත් පත් දැන්වීම් පළ කරමින් ප්‍රසම්පාදන පිළිවෙත් අනුව දැනට නිෂ්කාර්ය ඉඩ ප්‍රමාණයන් බදු දීමට ක්‍රියා කරමින් පවතී. | සංස්ථාවේ දේපල ආදායම් ඉපයීම සඳහා කාර්යක්ෂමව යොදාගත යුතුය. |

### 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලය මුළු තනතුරු 365 කින් සමන්විත වූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විට අතිරික්ත සේවක සංඛ්‍යාව 69 ක් හා පුරප්පාඩු සංඛ්‍යාව 46 ක් විය. | පුරප්පාඩු පියවීම සඳහා එම වර්ෂය තුල ප්‍රතිපාදන නොතිබූ අතරම රජයේ චක්‍රලේඛ ප්‍රකාරව සියළුම බඳවා ගැනීම තාවකාලිකව අත්හිටුවා තිබිණි. තවද ආයතනයේ අතිරික්ත සේවකයන් ලෙස සේවකයන් **69** සඳහන් කර ඇතත්, සියළුම සේවකයන් ව්‍යපෘති සහ දෛනික මෙහෙයුම් කටයුතු සඳහා උපයෝජනය කර ඇත. | සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලය පවත්වාගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් තුළ සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත 2022 ජනවාරි 06 වන දින මාස 22 ක ප්‍රමාදයකින් පසුව ඉදිරිපත් කර තිබුණු අතර කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | එකග වෙමි. සංස්ථාවේ පරිපාලිත සමාගමක් වන සතොස ඉදිකිරීම් සහ ඉංජිනේරු සමාගමේ 2017 , 2018 , 2019 වර්ෂ වලට අයත් මූල්‍ය ප්‍රකාශන පිළියල කර ඒකාබද්ධ ගිණුම් සකස් කිරීමට වසරක් පමණ ප්‍රමාද වීම නිසා සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියල කිරීම සහ විගණනයට ඉදිරිපත් කිරීමට ප්‍රමාද වූ බව දන්වා සිටිමි. **2021** වසරේ සිට නියමිත දිනයට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කල යුතුය. |